# වී වගාවේ යෙදවුම් භාවිතයේ කාර්යක්‍ෂමතාව

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ආර්.එම්.එන්. මධුවන්ති** [1]

**ඩබ්.එම්. සේමසිංහ** [2]

**සංක්ෂේපය**

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ සාපේක්‍ෂ දායකත්වය ඉහළ මට්ටමක පවතී. ඒ අතර වී වගා අංශය සඳහා හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ශ්‍රී ලංකාවේ දහස් සංඛ්‍යාත සුළු ගොවි පිරිසකගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය නිසා ජාතික ආර්ථිකයෙහි ලා මෙම බෝගය මඟින් විශාල දායකත්වයක් සපයනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ ප්‍රධාන ඉලක්කය බවට පත්ව තිබෙන්නේ රට සහලින් ස්වයංපෝෂිත කිරීමයි. නිදහසින් පසු බලයට පත් වූ රජයන් විසින් වී වගාව නංවාලීම අරමුණු කර ගනිමින් විවිධ උපාය මාර්ග හඳුන්වා දුන් අතර එහි ප්‍රතිඵල වශයෙන් වී වගාවේ සෑම අංශයකම සැලකිය යුතු වර්ධනයක් ඇති වුවද එම වර්ධනය දේශීය සහල් ඉල්ලුමේ වර්ධනය හා සමපාත නොවීය. දේශීය වී ගොවිතැනෙහි දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වනුයේ දිවයිනේ ඉතා සුළු ප්‍රදේශ කිහිපයක හැර සමස්තයක් වශයෙන් වී ගොවිතැන තවමත් යැපුම් මට්ටමේ පැවතීමත් , දිවයිනේ බොහෝ ප්‍රදේශයන්හි වී ගොවිතැන අලාභදායි කාර්යයක් බවට පත්ව තිබීමත් ය. ගොවිපල ප්‍රමාණය කුඩාවීම, ප්‍රාග්ධන හිඟය, නව තාක්ෂණය භාවිත නොවීම, යෙදවුම් මිළ ඉහළ යාම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම යනාදි ගැටලු නිසා දේශීය වශයෙන් වී ගොවිතැනෙහි අහිතකර තත්ත්වයන් ඇති වී තිබේ. වී නිෂ්පාදනය ඉහළ නංවාලීම සඳහා යෙදවුම් භාවිතයේ කාර්යක්‍ෂමතාව ඇති කළ යුතුය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ වී වගාවේ යෙදවුම් ඵලදායිතාවයේ පවත්නා කාර්යක්ෂමතාව හඳුනා ගැනීමයි. අධ්‍යයන ක්‍රමවේදය ලෙස ආර්ථික විද්‍යා විෂය තුළ යෙදවුම් සහ නිමැවුම් අතර පවත්නා සම්බන්ධතාව අධ්‍යයන කිරිම සඳහා යොදා ගනු ලබන ප්‍රධානම ක්‍රමයක් වන "නිෂ්පාදන ශ්‍රිත" විශ්ලේෂණ ක්‍රමය යොදාගනු ලැබේ. මෙහිදී යෙදවුම්වල ඵලදායිතාව ඇස්තමේන්තු කිරීම සඳහා"Cobb-Douglas" නිෂ්පාදන ශ්‍රිත විශ්ලේෂණ ක්‍රමය යොදාගනු ලැබීය. කොබ් ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිත විශ්ලේෂණ ක්‍රමය උපයෝගී කරගෙන විවිධ පුද්ගලයන් විසින් වී නිෂ්පාදනය සහ ඵලදායිතාව පිළිබඳ කරන ලද අධ්‍යයනයන් හඳුනාගැනීමත්, නිෂ්පාදන ශ්‍රිත විශ්ලේෂණයේ න්‍යායාත්මක හා ප්‍රායෝගික භාවිතය පිළිබඳව අධ්‍යයනය කිරීමත්, වී වගාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබීමත්, ප්‍රත්‍යක්‍ෂමූල අධ්‍යයන මත පදනම්ව දත්ත විශ්ලේෂණය කිරීමත් සිදු කරනු ලැබීය. අධ්‍යයනය මඟින් පැහැදිලි වූයේ වී වගාවේ යෙදවුම් භාවිතය අකාර්යක්‍ෂම මට්ටමක පවතින බවයි.

---

*1. ආර්ථික විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*